# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

01. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) අධි පන්තිය (විශේෂ ශ්‍රේණිය) තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීම සහ සේවා කොන්දේසි :*

මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිත ය. මෙම තනතුර සඳහා හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන් ට ඔබ යටත් විය යුතු ය.

| | | |
|---|---|---|
| වැටුප් කේත අංකය | : | MN 7 - 2016 |
| වැටුප් පරිමාණය | : | රු. 41,580 - 11X755 - 18X1,030- රු. 68,425/- |
| ආරම්භක වැටුප | : | රු. 43,865 (4 පියවර) |
| කුසලතා මත බඳවා ගැනීම | : | සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත බඳවා ගනු ලැබේ. |
| බඳවා ගන්නා ශ්‍රේණිය | : | විශේෂ ශ්‍රේණිය |

I. සුදුසුකම් :

- අධ්‍යාපන සුදුසුකම් :
- වෘත්තීය සුදුසුකම් :

} අදාළ නොවේ

- පළපුරුද්ද : අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණික (MN - 03) සේවා ගණයේ I වැනි ශ්‍රේණියේ අවම වශයෙන් වසර (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හයම (06) ම උපයාගෙන තිබීම.

- කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

- වෙනත් :
  - I. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
  - II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හයක් (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
  - III. I වන ශ්‍රේණියට නියමිත III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
  - IV. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය 2.1 හි සඳහන් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන්වන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

- වයස් සීමාව : අදාළ නොවේ

03. *බඳවා ගැනීමේ ක්‍රමය :* රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාව සඳහා ලකුණු ලබාදෙන යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ

සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරුකර ගැනීමෙන් අනතුරුව යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

- ලිඛිත විභාගය : අදාළ නොවේ

- වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

- සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ
  (යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ම සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ.)

- යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද :<br>■ සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍ය අනිවාර්ය සේවා කාලය ඉක්මවා වැඩි ම අමතර සේවා කාලයක් සහිත නිලධාරියාට උපරිම ලකුණු ලබාදෙන අතර සෙසු නිලධාරීන්ට ඊට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.<br>(01/2019 චක්‍රලේඛය අනුව) | 50 | |
| කුසලතාවය :<br>■ අධීක්ෂණ රාජකාරි - 25<br>(පවරන ලද රාජකාරි ඉටු කරවීම)<br>■ විෂයානුබද්ධ පාඨමාලා සහ ජාතික/ - 10<br>ජාත්‍යන්තර වැඩමුළු සඳහා සහභාගී වීම -<br>■ ප්‍රශංසා ලිපි/ සේවය ඇගයීමේ ලිපි - 05<br>■ ඉටුකරන ලද සුවිශේෂී කාර්යයන් - 05<br>(නිරවද්‍යතාව සනාථ කළ යුතුය) | 45 | අදාළ නොවේ |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සහ සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඉහළ ම ලකුණු ලබාගෙන ඇති නිලධරයා මෙම තනතුර සඳහා බඳවාගනු ලැබේ.

04. අයදුම්පත්, අමුණා ඇති ආකෘති පත්‍රය අනුව A4 (8.27 x 11.69) ප්‍රමාණයේ කඩදාසියක අංක 1.0 සිට 2.0 වන තෙක් කඩදාසියේ පළමුවැනි පිටුවේද , ඉතිරි කොටස් දෙවන පිටුවේ ද වන පරිද්දෙන් පිළියෙල කර 2022.12.16 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අදාළ ආකෘතියට නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.